**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිසාපති නිල නිවස, රාජ්‍ය සේවා පුහුණු ආයතනය සහ</u>**
**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19ක් සඳහා</u>**
**<u>ශුද්ධ පවිත්‍ර කිරීම හා සනීපාරක්ෂක සේවාව සැපයීම - 2027</u>**

| අයිතම අංකය | පිරිසිදු කළ යුතු ස්ථානය | පිරිසිදු කිරීමේ විස්තර |
|---|---|---|
| 01 | කාර්යාලයේ පොදු ස්ථානවල පවතින ටයිල් ඇතිරූ බිම | 1. දිනපතා ගෙබිම අතු ගා පිස දමා පිරිසිදු කිරීම. (Damp Mopping)<br>2. සේදුම් කාරක (Detergent) යොදා සතියකට වරක් ගෙබිම අතු ගා පිස දමා පිරිසිදු කිරීම. |
| 02 | ලී බඩු හා සවි කිරීම් උපකරණ | සතියකට වරක් පැල්ලම් සහ දූවිලි පිසදැමීම සහ විෂ බීජ නාශක යොදා පිරිසිදු කිරීම. |
| 03 | වීදුරු ජනෙල් දොරවල් සහ ඇළුමිනියම් වෙන්කිරීම්. | 1. සතියකට දෙවරක් වීදුරු පිස දැමීම, දෙසතියකට වරක් වීදුරු සේදුම් කාරක (Glass Cleaning Detergent) යොදා දොර ජනෙල් රාමු සහ වීදුරු සම්පූර්ණයෙන් පිරිසිදු කිරීම.<br>2. මසකට වරක් දොර ජනෙල් සහ ඇළුමිනියම් වෙන්කිරීම්වල වානේ රාමුව ඔප දැමීම (With Metallic) සහ ළඟාවිය නොහැකි උස් ස්ථානවල පිහිටි වීදුරු ජලය යොදා පිරිසිදු කිරීම. |
| 04 | සතියේ වැඩ කරන දිනවල වැසිකිළි පිරිසිදු කිරීම. | 1. වාර ගණනකට සීමා නොකර විෂබීජනාශක රසායන ද්‍රව්‍ය යොදා වැසිකිළි බිම, බිත්ති පිරිසිදු කිරීම, අනුමත වැසිකිළි සේදුම් කාරක (Toilet Cleaners) යොදා වැසිකිළි පෝච්චි, කොමඩ්, මුහුණ සෝදන බේසම්, කණ්නාඩි සහ අනෙකුත් සවිකිරීම් උපකරණ හා පිඟන් ගඩොල් සහිත බිම හා බිත්ති පිරිසිදු කිරීම. (දුර්ගන්ධය ඉවත්වන සේ)<br>2. අවශ්‍ය වූ විට / දැනුම් දුන් වහාම වැසිකිළි සහ සෝදන බේසම්වල ඇතිවන අවහිරතා ඉවත් කිරීම සහ වාකවුළු පිරිසිදු කිරීම. |
| 05 | සෙනසුරාදා දිනවල වැසිකිළි පිරිසිදු කිරීම. | 1. දිනකට දෙවරක් විෂබීජ නාශක රසායනික ද්‍රව්‍ය හා සේදුම් කාරක (Toilet Cleaners)යොදා වැසිකිළි පෝච්චි, කොමඩ්, මුහුණ සෝදන බේසම්, කණ්ණාඩි සහ අනෙකුත් සවිකිරීම් උපකරණ හා පිඟන් ගඩොල් සහිත බිම හා පොළව පිරිසිදු කිරීම.<br>2. අවශ්‍ය වූ විට/දැනුම් දුන් වහාම වැසිකිළි සහ සෝදන බේසම්වල ඇතිවන අවහිරතා ඉවත් කිරීම සහ වාකවුළු පිරිසිදු කිරීම. |
| 06 | විදුලි සෝපානය | 1. දිනපතා සෝපානය අතුගෑම සහ පිස දැමීම (Damp Mopping) විෂ බීජ නාශක යොදා බිත්තිය පිරිසිදු කිරීම , සෝපානය ඇතුලත, යතුරු පුවරුව කණ්නාඩිවල පැල්ලම් ඉවත් කර පිරිසිදු කිරීම.<br>2. සතිපතා සෝපානයේ වාකවුළු පිරිසිදු කිරීම සහ සෝපානයේ ඇතුලත බිත්ති ඔප දැමීම. |

| | | |
|---|---|---|
| 07 | වහලය | මාස්පතා වහලයේ සහ වැහිපිහිලිවල තැන්පත් වී ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම. |
| 08 | රැස්වීම් ශාලා සහ සම්මන්ත්‍රණ ශාලාව | රැස්වීම් පැවැත්වෙන සෑම දිනයකම එම රැස්වීම්වලින් පසුව ශාලාවල පුටු හා මේස පිස දමා බිම අතු ගා පවිත්‍ර කිරීම. (Vacuum Cleaning) |
| 09 | බාහිර බිත්ති සහ තිර යෙදු බිත්ති | මතුපිට ඇති දූවිලි සහ මකුළු දැල් පිස දමා පිරිසිදු කිරීම. |
| 10 | ගෙවත්ත (ගොඩනැගිල්ලේ බාහිර කාර්යාල පරිශ්‍රය) | 1. දිනපතා අතුගෑම සහ දෙසතියකට වරක් තණකොළ කැපීම මල් පැල අතර ඇති තණකොළ ගැලවීම.<br>2. මල් පැල, මල් පෝච්චි හා තණ බිම්වලට අවශ්‍යතාව පරිදි ජලය යෙදීම සහ නඩත්තු කිරීම.<br>3. කාර්යාල වටා පිහිටි කාණු පද්ධතිය පිරිසිදු කිරීම සහ පිරිසිදුව පවත්වාගෙන යාම, ජලය බැස නොයන සහ මදුරුවන් බෝවීමට ඉඩ ඇති ස්ථානවල ජලය ඉවත් කිරීමට කටයුතු කිරීම. |
| 11 | රබර් පාපිසි | සතියකට වරක් පිරිසිදු කිරීම හා අවශ්‍ය වන වෙනත් අවස්ථාවලදී සෝදා පිරිසිදු කිරීම. |
| 12 | කසල බඳුන් | කාර්යාලවලින් ඉවතලන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය කසල බඳුන්වල එක් රැස්වීමට සලස්වා දිනපතා ඉවත් කිරීම. |

13. මීට අමතරව කාර්යාලයේ විශේෂ රැස්වීම්, වැඩසටහන් ආදි අවස්ථාවල දී අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරි ද ඉටු කළ යුතු වේ.

<u>**ශ්‍රවණාගාර ගොඩනැගිල්ල හා අවට පරිශ්‍රය සඳහා ඉටු කළ යුතු කාර්යයන්**</u>

| අයිතම අංකය | පිරිසිදු කළ යුතු ස්ථානය | පිරිසිදු කිරිමේ විස්තරය |
|---|---|---|
| 01 | ටයිල් කළ බිම<br>බිම් මහළ<br>පළමු මහළ<br>දෙවන මහළ | දිනපතා ගෙබිම අතුගා පිස දමා පිරිසිදු කිරිම.<br>සේදුම් කාරක යොදා සතියකට වරක් ගෙබිම අතු ගා පිස දමා පිරිසිදු කිරිම. |
| 02 | ශ්‍රවණාගාරයේ පොදු ස්ථානවල පවතින ලී බඩු හා සවි කිරිම් උපකරණ | සතියකට වරක් පැල්ලම් සහ දූවිලි පිස දැමීම සහ විෂ බීජ නාශක යොදා පිරිසිදු කිරිම. |
| 03 | විදුරු ජනෙල් දොරවල් | සතියකට දෙවරක් විදුරු පිස දැමීම, දෙසතියකට වරක් විදුරු සේදුම් කාරක යොදා දොර ජනෙල් රාමු සහ විදුරු සම්පූර්ණයෙන් පිරිසිදු කිරිම. |
| 04 | අත් වැටවල් | දිනපතා පිරිසිදු කිරිම හා ඔප දැමීම. |
| 05 | වැසිකිළි පිරිසිදු කිරිම | 1. සතියේ හා සති අන්තයේ සම්මන්ත්‍රණ පැවැත්වෙන දිනවල වාර ගණනකට සීමා නොකර විෂ බීජ නාශක රසායන ද්‍රව්‍ය යොදා වැසිකිළි බිම, බිත්ති, පිරිසිදු කිරිම, කණ්නාඩි සහ අනෙකුත් සවිකිරිම් උපකරණ හා පිඟන් ගඩොල් සහිත බිම පිරිසිදු කිරිම. (දුර්ගන්ධය ඉවත් වන සේ) |

| | | |
|---|---|---|
| | | 2. අවශ්‍ය වූ විට / දැනුම් දුන් වහාම වැසිකිළි සහ සෝදන බේසම්වල ඇතිවන අවහිරතා ඉවත් කිරිම සහ වාකවුළු පිරිසිදු කිරිම.<br>3. සම්මන්ත්‍රණ නොමැති දිනවල දිනකට එක් වරක් විෂ බීජ නාශක රසායන ද්‍රව්‍ය යොදා වැසිකිළි බිම, බිත්ති, පිරිසිදු කිරිම, කණ්නාඩි සහ අනෙකුත් සවිකිරිම් උපකරණ හා පිඟන් ගඩොල් සහිත බිම පිරිසිදු කිරිම.<br>(දුර්ගන්ධය ඉවත් වන සේ) |
| 06 | සම්මන්ත්‍රණ ශාලාව | රැස්වීම් පැවැත්වෙන සෑම දිනකම රැස්විමට පෙර හා පසු පුටු සහ මේස පිස දමා බිම අතුගා පවිත්‍ර කිරිම (vacuum cleaner) තිර රෙදි මසකට වරක් දූවිලි ඉවත් වන සේ පිරිසිදු කිරිම. (Curtain Cleaning) |
| 07 | කසල බඳුන් | සම්මන්ත්‍රණ පැවැත්වෙන දිනවල ඉවතලන ද්‍රව්‍ය කසල බඳුන්වල රැස් කර අවස්ථානුකූලව ඉවත් කිරිම අනිකුත් දිනවල දිනපතා ඉවත් කිරිම. |
| 08 | ආපන ශාලාව | බැහැර කරන කසල නියමිත වර්ගීකරණයට ලක් කර ඉවත් කිරීම. |
| 09 | ශ්‍රවණාගාර ගොඩනැගිල්ල අවට | ශ්‍රවණාගාර ගොඩනැගිල්ල අවට පරිශ්‍රය පිරිසිදු කිරීම සහ පිරිසිදුව පවත්වාගෙන යාම. |

<u>**පවිත්‍රතා සේවා සඳහා සේවකයින් යෙදවිය යුතු ආකාරය**</u>

| **කාර්යාලය / පරිශ්‍රය** | **සේවක සංඛ්‍යාව** |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල හා ශ්‍රවණාගාර ගොඩනැගිල්ල | සේවකයින් 11 (එක් අධික්ෂණ සේවකයෙකු සහ අවම වශයෙන් පිරිමි සේවකයන් දෙදෙනෙක් සහිතව) |
| දිසාපති නිල නිවස | එක් සේවකයෙක් |
| කටුගස්තොට **රාජ්‍ය** සේවා පුහුණු ආයතනය | එක් සේවකයෙක් |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 19 සඳහා | එක් කාර්යාලයකට එක් සේවකයෙක් බැගින් |

දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මහනුවර

******